# උතුරු මැද පළාතේ පළාත් සභා පාසල් වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා පාසල් පාදකව, සංවර්ධන නිලධාරී ලෙස පත්වීම් ලැබූ උපාධිධාරීන් හා ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීම - 2022

**අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ED/02/29/21/AI/01/2020 හා 2021.12.31 දිනැති ලිපිය හා 2021/04/19 දිනැති අංක අමප/21/0658/340/013 දරන අමාත්‍ය මණ්ඩල තීරණයත්, 2021/12/21 දිනැති අංක අමප/21/2076/315/003-1 දරණ අමාත්‍ය මණ්ඩල තීරණයත්, අති විශේෂ ගැසට් පත්‍ර අංක 1885/38 හා 2014/10/23 දිනැති ශ්‍රී ලංකා ගුරු ව්‍යවස්ථාවේ විධිවිධානත් ප්‍රකාරව, උතුරු මැද පළාතේ පළාත් පාසල්වල 01/2016 චක්‍රලේඛයේ අනුමත ගරු කාර්ය මණ්ඩල සංඛ්‍යාව අනුව 2022.06.30 දිනට පවතින ගුරු පුරප්පාඩු 1993 ක් සඳහා පාසල් පාදකව බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.**

**01.** මේ සඳහා අයදුම් කළ හැක්කේ පහත නිලධාරී කාණ්ඩයන්ට අයත් නිලධාරීන් සඳහා පමණි

I. උපාධිධාරින් රැකියාගත කිරීමේ වැඩසටහන - 2020 යටතේ බඳවාගනු ලැබූ සියලුම උපාධිධාරී අභ්‍යාසලාභීන්.

II. 2018 සහ 2019 වසරවලදී ක්‍රියාත්මක කළ "අභ්‍යාසලාභී උපාධිධාරීන් හට රජයේ ආයතනවල පුහුණුවක් ලබා දීම" වැඩසටහන යටතේ උපාධිධාරීන් අභ්‍යාසලාභීන් ලෙස පුහුණුවට බඳවාගනු ලැබ 2020.01.01 සහ 2021.01.01 දින සිට සංවර්ධන නිලධාරී සේවයේ ස්ථිර පත්වීම් ලැබූ කණ්ඩායම.

III. ඩිප්ලෝමාධාරීන් බඳවා ගනු ලබන විෂයයන් සඳහා ඉහත 2020, 2019 හා 2018 කණ්ඩායම්වල ඩිප්ලෝමාධාරීන්.

**02.** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය විෂයයන් සඳහා පාසල් පාදකව උපාධිධාරීන් හා ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීම සිදු කරන අතර ඒ ඒ පාසලේ පවතින විෂයය පුරප්පාඩු සඳහා අයදුම් කළ හැකි ය. එසේ අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී අයදුම් කළ හැක්කේ ප්‍රමුඛතාව මත උපරිම පාසල් සංඛ්‍යාව 03 ක් සඳහා පමණි. ඉල්ලුම් කළ හැකි විෂය ගණන 03 කි. එම විෂයයන්ට අදාළව පළාතේ ඕනෑම පාසල් 3 ක් කැමැත්තේ ප්‍රමුඛතාව අනුව ඉල්ලුම් කළ හැකි ය. එක් එක් පාසලේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලට අදාළ විෂයය පුරප්පාඩු උපලේඛනයෙහි දැක්වේ.(පුරප්පාඩු ලේඛණය උපලේඛණ 01 හි දක්වා ඇත)

**03.** අයදුම් කර ඇති විෂයයට අදාළ ප්‍රායෝගික පරීක්ෂණයේදී වැඩිම ලකුණුලාභියා/ලකුණුලාභීන් තෝරාගැනීම සිදු කරන අතර අයදුම්කරු විසින් ඉදිරිපත් කර ඇති පාසැල් ප්‍රමුඛතාව අනුව තෝරා ගැනීම සිදු කරනු ලැබේ. (ප්‍රායෝගික පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණු කුසලතාවය ඉල්ලුම් කර ඇති පාසල සඳහා පත් කිරීමට ප්‍රමාණවත් නොවන අවස්ථාවක අයදුම්පත්‍රයේ 9.4 යටතේ එකගතාවය ලබාදී ඇති අයදුම්කරුවන් අතරින් සුදුසුකම්ලාභීන් ඒ ඒ විෂයන් සඳහා පුරප්පාඩු පවතින පළාත තුළ වෙනත් ඕනෑම පාසලක් සඳහා පත් කිරීමේ බලය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය).

**04.** පහත සඳහන් සිංහල හා දෙමළ මාධ්‍යය විෂයයන් සඳහා ඉහත 01 හි සුදුසුකම් සම්පූර්ණ කරන ලද වෙනත් පළාත්වල පදිංචිකරුවන්ට ද ඉල්ලුම් කළ හැකි ය. අදාළ විෂය පුරප්පාඩුවට බඳවා ගැනීමේදී උතුරු මැද පළාත තුළ ස්ථිර පදිංචි සුදුසුකම්ලාභීන් නොමැති අවස්ථාවකදී පමණක් වෙනත් පළාත්වල ස්ථිර පදිංචි අයදුම්කරුවන් සම්බන්ධයෙන් සළකා බලනු ලැබේ.

| මාධ්‍යය හා විෂයය | |
|---|---|
| **සිංහල** | **දෙමළ** |
| සා/පෙළ ගණිතය | සා/පෙළ ගණිතය |
| සා/පෙළ විද්‍යාව | සා/පෙළ විද්‍යාව |
| සා/පෙළ දෙවන බස (දෙමළ) | - |
| - | සා/පෙළ දෙවන බස (සිංහල) |

| | |
|---|---|
| සා/පෙළ තොරතුරු සන්නිවේදන තාක්ෂණය | සා/පෙළ තොරතුරු සන්නිවේදන තාක්ෂණය |
| සා/පෙළ චිත්‍ර | සා/පෙළ චිත්‍ර |
| උ/පෙළ තොරතුරු සන්නිවේදන තාක්ෂණය | උ/පෙළ තොරතුරු සන්නිවේදන තාක්ෂණය |
| උ/පෙළ ජෛව පද්ධති තාක්ෂණවේදය | උ/පෙළ ජෛව පද්ධති තාක්ෂණවේදය |
| උ/පෙළ තාක්ෂණවේදය සඳහා විද්‍යාව | උ/පෙළ තාක්ෂණවේදය සඳහා විද්‍යාව |
| උ/පෙළ ඉංජිනේරු තාක්ෂණවේදය | උ/පෙළ ඉංජිනේරු තාක්ෂණවේදය |
| උ/පෙළ රසායන විද්‍යාව | උ/පෙළ රසායන විද්‍යාව |
| උ/පෙළ භෞතික විද්‍යාව | උ/පෙළ භෞතික විද්‍යාව |
| උ/පෙළ ජීව විද්‍යාව | උ/පෙළ ජීව විද්‍යාව |
| උ/පෙළ සංයුක්ත ගණිතය | උ/පෙළ සංයුක්ත ගණිතය |

| **13 වසරක සහතික කරන ලද අනිවාර්ය අධ්‍යාපනය** |
|---|
| ළමා මනෝ විද්‍යාව හා ආරක්ෂණය<br>Child Psychology and care |
| සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණය<br>Health & Social Care |
| ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා<br>Physical Education & Sports |
| ප්‍රාසංගික කලාව<br>Performing Arts |
| කාර්යසිද්ධි කළමනාකරණය<br>Event Management |
| ශිල්ප කලා<br>Art & Craft |
| අභ්‍යන්තර නිර්මාණකරණය<br>Interior Designing |
| විලාසිතා නිර්මාණකරණය<br>Fashion Designing |
| ග්‍රැෆික් නිර්මාණකරණය<br>Graphic Designing |
| භූ දර්ශන නිර්මාණකරණය<br>Landscaping |
| ව්‍යවහාරික උද්‍යාන විද්‍යා තාක්ෂණ අධ්‍යයනය<br>Applied Horticultural Studies |
| පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය<br>Livestock Product Studies |
| ආහාර නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය<br>Food Processing Studies |
| වැවිලි බෝග නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය<br>Plantation Product Studies |
| ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යයනය<br>Construction Studies |
| මෝටර් යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනය<br>Automobile Studies |
| විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණ අධ්‍යයනය<br>Electrical and Electronic Studies |

| |
|---|
| පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණ අධ්‍යයනය<br>Textile & Apparel Studies |
| ලෝහ සැකසුම් තාක්ෂණ අධ්‍යයනය<br>Metal Fabrication Studies |
| ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණ අධ්‍යයනය<br>Aluminium Fabrication Studies |
| පරිගණක දෘඩාංග සහ ජාලකරණය<br>Computer Hardware and Networking |
| නිෂ්පාදනය<br>Manufacturing |
| සංචරණය හා ආගන්තුක සත්කාර<br>Tourism and Hospitality |

**05.** පවතින ප්‍රතිපාදන හා සේවා අවශ්‍යතාව මත බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

**06.** **වැටුප් ක්‍රමය:**

මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ගුරු සේවයේ නිත්‍ය පත්වීමක් ලෙස පරිවර්තනය වන්නේ බඳවාගැනීමෙන් පසු වසර 3 ක් අවසානයේ පවත්වනු ලබන විභාගයෙන් සමත් වන පත්වීම්ලාභීන් සඳහා පමණි.
තාවකාලික ගුරු පත්වීම් කාලසීමාව තුළ, සංවර්ධන නිලධාරි තනතුරට හිමි වැටුප් පරිමාණයට අදාළව වැටුප් ගෙවනු ලබන අතර, ගුරු සේවයේ නිත්‍ය පත්වීම් ලද පසු ගුරු සේවා ව්‍යවස්ථාවේ අදාළ වැටුප් පියවරේ පිහිටවනු ලැබේ.
එතෙක් ගෙවන වැටුප වන්නේ සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවට අදාළ වැටුප් පරිමාණය වේ.

**07.** **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්:**

7.1 අධ්‍යාපන සුදුසුකම්:

I. ඉගැන්වීම් කාර්යයන් සඳහා පිළිගත් සුවිශේෂි කරනලද ක්ෂේත්‍රවලට අයත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් මගින් හෝ ප්‍රදානය කරනු ලැබූ, උපලේඛන 02 හි සඳහන් කර ඇති විෂයයන්ට අදාළ උපාධියක් හෝ ඩිප්ලෝමාවක් ලබා තිබීම

සහ

II. අංක 1885/38 හා 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ සටහන 6 වගන්තිය ප්‍රකාරව අයදුම් කරනු ලබන සෑම අයදුම්කරුවෙකුම අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව විෂයක් වශයෙන් සමත් වී තිබිය යුතුය.

ඉතා වැදගත්:- (ඉල්ලුම් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී සැලකිල්ලට ගත යුතු ය)

- ස්වකීය උපාධිය/ඩිප්ලෝමාව අනුව ඉල්ලුම් කළ හැකි විෂයයන් පිළිබඳව අයදුම්කරුවන් සැලකිලිමත් විය යුතු ය.
- උපාධියට/ඩිප්ලෝමාවට හදාරා ඇති ප්‍රධාන විෂයය / විෂයයන් අනුව පමණක් අදාළ ගුරු පුරප්පාඩු සඳහා ඉල්ලුම් කළ යුතුය.
- ඉල්ලුම් කළ විෂයය/විෂයයන් සහ පාසල් කිසිදු හේතුවක් මත හෝ පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නො ලැබේ.

7.2 කායික සහ මානසික යෝග්‍යතාව:

සෑම අපේක්ෂකයෙකු ම ගුරුවරයෙකු වශයෙන් රාජකාරි ඉටු කිරීමට සරිලන මානසික සහ ශාරීරික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

7.3 වයස:

2019.12.31 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය.

<u>සටහන</u>

"2020 උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන" යටතේ බඳවාගත් අභ්‍යාසලාභීන්ගේ, 2020.01.01 දින සිට සහ 2021.01.01 දින සිට සංවර්ධන නිලධාරී සේවයට බඳවාගත් උපාධිධාරීන්ගේ 2019.12.31 දිනට වයස අවුරුදු 35ට අඩු සේ සලකනු ලැබේ.

7.4 වෙනත් සුදුසුකම්:

I. අයදුම්කරු /අයදුම්කාරිය ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

II. විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතු ය.

III. උතුරු මැද පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ හැකි විය යුතු ය.

IV. (අ) පුරප්පාඩු සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන් උතුරු මැද පළාත් සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන් විය යුතු ය. (ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකයක් මඟින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී පදිංචිය සනාථ කළ යුතු ය.)

(ආ) 04 ඡේදයේ සඳහන් සිංහල හා දෙමළ මාධ්‍යය විශේෂ විෂයයන් සඳහා අයදුම්කරන ලද වෙනත් පළාත් වල පදිංචි අයදුම්කරුවන් තමන් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකයක් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු ය.

**08. සේවා කොන්දේසි :-**

I. මෙසේ ලබාදෙන පත්වීම් තාවකාලික පත්වීම් වන අතර, තාවකාලික පත්වීම් ලබා දී වසර 3 ක් ඇතුළත ගුරු සේවා ව්‍යවස්ථාවේ 7.2.4.1 අනුව ලිඛිත විභාගයක් පවත්වා ඉන් සමත්වන නිලධාරීන් සඳහා නිත්‍ය ගුරු පත්වීම් ලබා දෙනු ලැබේ.

II. ඉහත විභාගයෙන් අසමත් වන අයදුම්කරුවන් සඳහා වසරක් තුළ නැවත විභාගයක් පවත්වා ඉන් සමත් වන අය සඳහා නිත්‍ය ගුරු පත්වීම් ලබාදෙනු ලැබේ. ඉන් අසමත් වන අය පෙර සිටි තනතුරට පත් කිරීම හෝ උපාධිධාරී අභ්‍යාසලාභීන් සංවර්ධන නිලධාරීන් ලෙස අනුයුක්ත කිරීම හෝ විභාගය අසමත්වන ඩිප්ලෝමාධාරීන්ගේ සේවය අවසන් කරනු ලැබේ.

III. රාජ්‍ය/පළාත් සභා රාජ්‍ය සේවා පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, උතුරු මැද පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසි වලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන හෝ සංශෝධනවලට ද, යටත්ව තෝරාගනු ලබන උපාධිධාරී හා ඩිප්ලෝමාධාරී අපේක්ෂකයින් අතුරින් වසර 3 ක් ඇතුළත පවත්වනු ලබන විභාගයෙන් සමත් වන අය පත්වීම් ලද දින සිට ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියට පත් කරනු ලැබේ.

IV. මෙම තනතුරට බඳවා ගැනීමෙන් පසුව වුව ද නිත්‍ය ගුරු සේවයට බඳවා ගන්නා තෙක් සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන හා එම සේවා ව්‍යවස්ථාව යටතේ ඔබට නිකුත් කර ඇති පත්වීම් ලිපියේ කොන්දේසි අදාළ වේ.

V. පත්වීම් ලබන පාසලේ වසර 05 ක් හා එම පාසල අයත් අධ්‍යාපන කොට්ඨාසයේ පාසල්වල තවත් වසර 02 ක් සේවය කළ යුතු ය. පත්වීම් ලබන පාසලේ හා එම කොට්ඨාසය තුළ වසර 07 ක සේවා කාලයකින් පසුව පමණක් පත්වීම්ලාභියාට ස්ථාන මාරු සඳහා අයදුම් කළ හැකි ය.

**09. බඳවා ගැනීම**

9.1 බඳවා ගැනීමේ ක්‍රමය :

(අ) උතුරු මැද පළාතේ පදිංචිකරුවන් ඒ ඒ පාසල්වල පවතින පුරප්පාඩු සඳහා පාසල් පාදක පදනම මත බඳවාගනු ලැබේ (උපලේඛන 01 ට අනුව). අදාළ පාසලේ ඒ ඒ විෂයයන් සඳහා ඉල්ලුම් කළ සියලුම ඉල්ලුම්කරුවන් සඳහා අංක 1885/38 හා 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ගුරු ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයක් හා ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වා ප්‍රායෝගික පරීක්ෂණයේ ලකුණු, කුසලතා අනුපිළිවෙල අනුව බඳවාගනු ලැබේ. ඒ අනුව ඉල්ලුම් කළ අයගේ මූලික අධ්‍යාපන සුදුසුකම් හා අයදුම්කරු ගුරුවරයෙකු ලෙස රාජකාරි කිරීමට ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත වන්නේ ද යන්න ද පරීක්ෂා කරනු ලැබේ.

9.2 සම්මුඛ පරීක්ෂණය:-

මෙම ගැසට් නිවේදනයේ සඳහන් මූලික සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම, කායික හා මානසික යෝග්‍යතාව පරීක්ෂා කිරීම සම්මුඛ පරීක්ෂණයේදී සිදු කරනු ලැබේ. මෙහිදී ලකුණු ලබාදීමක් සිදුනොවේ. සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කෙරේ.

9.3 ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීම (උපරිම ලකුණු 25)

ප්‍රායෝගික පරීක්ෂණයේ දී අයදුම්කරු විසින් අයදුම් කරන ලද විෂයකට අදාළ මාතෘකාවක් යටතේ විනාඩි පහකට (5) නොඅඩු ඉදිරිපත් කිරීමක් කළ යුතු ය. මෙහි දී අයදුම්කරුගේ ඉදිරිපත් කිරීමේ කුසලතාව සහ සන්නිවේදන කුසලතාව පිළිබඳ විශේෂයෙන් සලකා බලනු ලැබේ.

| අනු අංකය | ප්‍රායෝගික පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01 | අරමුණ හා ප්‍රවිශ්ට වීම | 05 |
| 02 | පෞරුෂය හා හඬ පාලනය | 05 |
| 03 | සන්නිවේදනයේ පැහැදිළි බව | 05 |
| 04 | කාල කළමනාකරණය | 05 |
| 05 | ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය | 05 |
| **මුළු ලකුණු ප්‍රමාණය** | | **25** |

**10. තෝරා ගැනීමේ ක්‍රමය :-**

(අ) මෙම ගැසට් නිවේදනයේ විධිවිධාන ප්‍රකාර ව බඳවාගැනීම සිදුකරනු ලැබේ.

(ආ) යම්කිසි අපේක්ෂකයෙකු විෂයයන් දෙකකට (02) හෝ තුනටම (03) තේරී පත් වී ඇති අවස්ථාවක පවතින පුරප්පාඩු හා ඉල්ලුම්කරුවන්ගේ සංඛ්‍යාව සලකා බලා එම අයට පත්වීම් ලබා දෙන විෂය පිළිබඳව උතුරු මැද පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

**11. අයදුම් කිරීමේ ක්‍රමය**

11.1 අයදුම්පත්‍ර මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව අපේක්ෂකයා විසින් කඩදාසියේ දෙපැත්ත භාවිත කරමින් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර තම අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතුය. 1 සිට 4 තෙක් වන ශීර්ෂය පළමු පිටුවේ ද 5 සිට 7 තෙක් දෙවන පිටුවේ ද, ඉතිරි ශීර්ෂ තෙවන පිටුවට ද වන පරිදි අයදුම් පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැළකිය යුතු ය.

11.2 නියමිත සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර නොමැති අයදුම් කරුවන්ගේ අයදුම්පත් හා නියමිත ආකෘතියට අනුකූලව සකස් නොකළ, අසම්පූර්ණ හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එම අයදුම් කරුවන්ට සම්මුඛ පරීක්ෂණයට හා ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටීම සඳහා ඉඩ දෙනු නොලැබේ. ඒ සම්බන්ධයෙන් පූර්ව දැනුම් දීමක් නොකෙරේ.(ඉදිරිපත් කරන අයදුම් පත්‍රයේ ඡායා පිටපතක් අයදුම් කරු විසින් තමා ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

11.3 දෘශ්‍යාබාධිත, ශ්‍රවනාබාධිත/ වෙනත් විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කෙරෙන අයදුම්පත් වල වම් පස උඩ කෙළවරේ රතු පාටින් තම ආබාධිත තත්ත්වය පැහැදිළිව සටහන් කළ යුතු ය.

11.4 **විෂයයන් කීපයක් සඳහා ඉල්ලුම් කරන්නේනම් අයදුම්පත්‍රයේ අදාළ විෂය අංක සහිතව, පැහැදිලිව එම විෂයයන් සටහන් කර එක් අයදුම්පතක් පමණක් ඉදිරිපත් කළ යුතුය.**

11.5 අයදුම්පතෙහි අපේක්ෂකයාගේ අත්සන අයදුම්කරු වර්තමානයේ සේවය කරන ආයතනයේ ආයතන ප්‍රධානියා හෝ බලය පවරන ලද නිලධාරියෙක් විසින් සිදුකළ යුතු ය.

11.6 රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් ස්වකීය අයදුම්පත අනිවාර්යෙන්ම තම ආයතන ප්‍රධානියා මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු වන අතර මෙම පත්වීම සඳහා සුදුස්සෙකු වශයෙන් තේරී පත්වුවහොත් එම ආයතනයෙන් නිදහස් කිරීමට එකඟ වන බවට සහතික කරවා ගත යුතු ය.

11.7 නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **2022.09.09** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ “ලේකම්,උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය, අනුරාධපුර”යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙලවරේ (උපාධිධාරීන්/ඩිප්ලෝමාධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම - 2022) **ලෙස හා ඉල්ලුම් කරන දිස්ත්‍රික්කය හා ඉල්ලුම් කරන විෂය අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතු ය.**

11.8 තැපැල් මඟින් ඉදිරිපත් කිරීමේදි අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම පිළිබඳව වූ කිසිදු පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ.

**12. අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය:-**

අපේක්ෂකයින් තමා පෙනී සිටින සම්මුඛ පරීක්ෂණය සහ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා පහත ලේඛණ වලින් තම අනන්‍යතාවය තහවුරු කළ යුතු ය.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

හෝ

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය / වලංගු රියදුරු බලපත්‍රය

**13.** ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කිරීමේ දී සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. එම තොරතුරු කිසිදු අයුරකින් සංශෝධනයට ඉඩදෙනු නොලැබේ. මෙම බඳවා ගැනීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් නියමිත දිනට සම්පූර්ණ කර නොමැති වීම අනුව යම් අයදුම්කරුවකු සම්මුඛ පරීක්ෂණයට

සහ ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටීමට නුසුදුසු බව අනාවරණය වුවහොත් ඒවා පැවැත්වීමට පෙර හෝ පැවැත්වෙන අතරතුර හෝ ඉන්පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකි ය. අයදුම්කරුවන් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක සේවයෙන් පහ කිරීමට හෝ සේවය අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ.

**14.** මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් වෙත උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් සම්මුඛ පරීක්ෂණය සහ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවීම් ලිපි නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත කැඳවීම් ලිපි නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යාලීය වෙබ් අඩවියේ (**psc.nc.gov.lk**) නිවේදනයක් පළකරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය හෝ ප්‍රායෝගික පරීක්ෂණය පැවැත්වෙන දිනට දින 3 කට පෙර කැඳවීම් ලිපිය නොලැබිණි නම් ඒ බව වහාම **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු මැද පළාත, අනුරාධපුර."** යන ලිපිනයට දැන්විය යුතු යි. එසේ දැනුම් දීමේ දී පහත විස්තර ඉදිරිපත් කළ යුතු ය.

I. අයදුම්කරුගේ සම්පූර්ණ නම:
II. සේවා ස්ථානයේ ලිපිනය:
III. ජාතික හැඳුනුම්පත් අංකය :
IV. දුරකථන අංකය :

අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ මෙම නිවේදනයෙන් ආවරණය නොවන හෝ මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති වෙනත් කිසියම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

**15.** මෙම සම්මුඛ පරීක්ෂණය සහ ප්‍රායෝගික පරීක්ෂණය පැවැත්වීම, කල්දැමීම, අවලංගු කිරීම හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම/ නොගැනීම හෝ සම්පූර්ණ කරනු ලබන පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ අවසාන තීරණය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු ය.

**16.** සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් ප්‍රසිද්ධ කරනු ලබන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.
2022.08.17